# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2179/15 - 2020 ජුනි මස 10 වැනි බදාදා - 2020.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට යෝජිත බද්දේගම ජල සම්පාදන ක්‍රමය යටතේ භූගත ජල තටාකයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේදී ය.
5-2/GL/04

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 184 ඒ, නයාපාමුල ග්‍රාම නිලධාරී වසමේ නයාපාමුල ගමේ පිහිටි මහගොඩකන්ද නමැති ඉඩමෙන් රූඩ් 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මහගොඩකන්ද පාර නොහොත් විහාර පාර, |
| *නැගෙනහිරට* | : | ඉසිපතනාරාමය සතු ස්තූපය සහිත කොටස, |
| *දකුණට* | : | ඉසිපතනාරාමය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස, |
| *බටහිරට* | : | සන්නිවේදන කුළුණ පිහිටි ඉඩම. |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය : 01. පූජ්‍ය බලගොඩ සිරිනිවාස හිමි, ඉසිපතනාරාමය, මහගොඩකන්ද, බද්දේගම.

06 - 189

1A - G 32312- 72 (2020/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පවිත්‍රාගාරය පුළුල් කිරීම සඳහා අමතර ඉඩම් කොටසක් හා තුළුමුවේ සිට ජල පවිත්‍රාගාරය දක්වා ප්‍රවේශ මාර්ගය හා නල එලීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් හි නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත, නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේදී ය.
5-2/KY/01

***උපලේඛනය***

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහල කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1058, වැටකෙදෙනිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වැටකෙදෙනිය ගමේ පිහිටි, ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන සකස් කරන ලද මු. පි. මහ 47872 න් කොටසක් වශයෙන් දැක්වෙන ''කබලකාව'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම තුළ පිහිටි අක්කර 03, රූඩ් 03, පර්චස් 20ක් පමණ වන ඉඩම් කොටස් හතර :

කැබලි අංක : 01
ඉඩමේ නම : කබලකාව
ප්‍රමාණය : අක්කර 03

***මායිම් :***

*උතුරට* : ජල පවිත්‍රාගාරය සඳහා අත් කර ගෙන ඇති ඉඩම සහ ඇල
*නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම,
*දකුණට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම,
*බටහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම.

කැබලි අංක : 02
ඉඩමේ නම : කබලකාව
ප්‍රමාණය : රූඩ් 01, පර්චස් 20

***මායිම් :***

*උතුරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම,
*නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම,
*දකුණට* : ඩබ්ලිව්. එච්. එම්. පිලපිටිය හිමිකම් කියන ඉඩම,
*බටහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම.

කැබලි අංක : 03
ඉඩමේ නම : කබලකාව
ප්‍රමාණය : පර්චස් 40

*මායිම් :*

*උතුරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම,
*නැගෙනහිරට* : ජල විදුලි බලාගාරය පිහිටි ඉඩම,
*දකුණට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම,
*බටහිරට* : ඩබ්ලිව්. එච්. එම්. පිලපිටිය හිමිකම් කියන ඉඩම.

කැබලි අංක : 04
ඉඩමේ නම : කබලකාව
ප්‍රමාණය : පර්චස් 40

*මායිම් :*

*උතුරට* : ඩබ්ලිව්. එච්. එම්. පිලපිටිය හිමිකම් කියන ඉඩම,
*නැගෙනහිරට* : ජල විදුලි බලාගාරය පිහිටි ඉඩම,
*දකුණට* : මා ඔය
*බටහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : කැබලි අංක 01, 02 හා කැබලි අංක 04, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, ගනේහේන, බත්තරමුල්ල.

කැබලි අංක 03 : ඩබ්ලිව්. එච්. එම්. පිලපිටිය මහතා, ඉල්ලවතුර, ගම්පොල.

06 - 190

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට කිරම කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ තුළුමං ළිඳ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
අංක 35, ලක්දිය මැඳුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය.
5-2/HB/08

**උපලේඛනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 554 පහල වත්ත ග්‍රාම නිලධාරී වසමේ පහලවත්ත නමැති ගමේ පිහිටි විදානගේ වත්ත සහ කිරිමඩුවේහේන නමැති ඉඩමෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | වරාපිටිය වැව, |
| *නැගෙනහිරට* | : | ඇල මාර්ගය, |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ කිරම - ඌරුබොක්ක මාර්ගය, |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය* : 01. ජයන්ත නිශේන්ද්‍ර විජේසූරිය මහතා, අංක 49, කොටුවේගොඩ, මාතර.

06 - 192

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට යෝජිත බද්දේගම ජල සම්පාදන ක්‍රමය යටතේ වැනියරවෙල භූගත ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය.
5-2/GL/03

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 192 ඒ, ගලහේන්කන්ද ග්‍රාම නිලධාරි වසමේ ගලහේන්කන්ද ගමේ පිහිටි ගිල්ක්‍රොෆ්ට් වත්ත නොහොත් අක්කර 27 ඉඩමෙන් රූඩ් 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස, |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස, |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස, |
| *බටහිරට* | : | ගලහේන්කන්ද පාර දක්වා දිවෙන අතුරු පාර. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය* : 01. දිනුලංක මුදලිගේ වීරසිංහ මහතා, 309/ඒ, පිට්ටනිය, ගලහේන්කන්ද, අම්පේගම.

06 - 192

**ශුද්ධි පත්‍රය**

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන වැඩ බලන අමාත්‍යවරයා විසින් 2019.07.30 දින හා අංක 2134/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 08 - 507 යටතේ පල කරන ලද නිවේදනයේ දක්වෙන නිශ්චල දේපළ අයිතිය යන්න පරවශතා අයිතිය ලෙස ද උපලේඛනයෙහි ඉඩමේ ප්‍රමාණය පර්චස් 2 ක් යන්න පර්චස් 15ක් ලෙස ද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර'',
පැලවත්ත,
බත්තරමුල්ල.
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1484

06-193

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.